DFCC බැංක් පීඩද්දි
පොදු නීතිරීති හා කොන්දේසි

1. අදාළ වීම

මෙම පොදු නීතිරීති සහ කොන්දේසි (ඉන් මතුවට මෙහි 'නීතිරීති හා කොන්දේසි' යනුවෙන් හැඳින්වෙනු ඇති අතර සන්දර්භයට ගැලපෙන හෝ අවශ්‍ය වන ස්ථානයන්හි දී එම යෙදුමට හෝ ප්‍රකාශනයට (මෙහි අන්තර්ගත ශ්‍රී ලංකා රුපියල් හෝ වෙනත් ආකාරයකින් පවත්වාගෙන යන) ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු ගිණුම් සහ ඉතිරිකිරීමේ ගිණුම් සඳහා ඇති නීතිරීති, කොන්දේසි සහ රීති ද ඇතුළත් වනු ඇති අතර), ශ්‍රී ලංකා ජනරජයේ නිසි ලෙස සංස්ථාපිත කර ඇති බැංකු සමාගමක් වන, කොළඹ 03, ගාලු පාර, අංක 73/5 දරන ස්ථානයේ ස්ථිතිය ලියාපදිංචි කාර්යාලය පිහිටි, ලියාපදිංචි අංක PQ 233 දරන සහ, 1988 අංක 30 දරන බැංකු පනතෙහි අර්ථයට අනුව අවසරලත් වාණිජ බැංකුවක් ලෙස ශ්‍රී ලංකා ජනරජය තුළ බැංකු ව්‍යාපාර කටයුතු සිදුකරන සහ, උක්ත පනත යටතේ සහ භාර ලැබීම් පනත යටතේ හා රහි කටයුතු සඳහා අනුමත ණයදෙන ආයතනයක් වන(ඉන් මතුවට DFCC හෝ බැංකුව යනුවෙන් හැඳින්වෙනු ඇති) සන්දර්භයට ගැලපෙන හෝ අවශ්‍ය වන ස්ථානයන්හි දී මෙහි භාවිත කර ඇති එම යෙදුම හෝ ප්‍රකාශනය ඉතින් එකී DFCC බැංක් පීඩද්දි සහ එහි අනුප්‍රාප්තිකයන් ද අදහස් වන සහ ඇතුළත් වන DFCC බැංක් පීඩද්දි සමග පවතින ගනුදෙනුකාර ගිණුම්, ගනුදෙනු වලට, අදාළ වනු ඇත.මෙම නීතිරීති හා කොන්දේසි (අදාළ ස්ථාන වලදී අවශ්‍ය වෙනස්කම් ද සහිතව) අනෙක්‍යතාය පරිදි පුද්ගලයන්, හවුල් ව්‍යාපාර, තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ණයකරුවන්, සංස්ථාපිත කළ සහ සංස්ථාපිත නොකළ ආයතන ද ඇතුළත්ව, නමුත් ඊට සීමා නොවී, සියලු ගනුදෙනුකරුවන්ට අදාළ වනු ඇත.

මෙම නීතිරීති හා කොන්දේසි වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ එකතු කිරීම සිදු කිරීමට බැංකුව විසින් අයිතිය රඳවා ගන්නා අතර, එම වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ එකතු කිරීම ඔබින් සියලුම ගනුදෙනුකරුවන් බැඳී සිටින බවට සැලකෙනු ඇත. මෙම නීතිරීති හා කොන්දේසි වලට සිදුකරන ඕනෑම සංශෝධනයක් නිල වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකි වනු ඇති අතර, බැංකුව විසින් ඒවා පිළිගත හැකි ආකාරයකින් සන්නිවේදනය කරනු ඇත.

මෙම නීතිරීති හා කොන්දේසි පිළිගැනීම ඔබින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති ගනුදෙනුකාර ප්‍රඥප්තියෙහි සහ කලින් කලට ඊට සිදුකරනු ලබන සංශෝධනයන්හි දක්වා ඇති පරිදි බැංකුව වෙත ගනුදෙනුකරුගේ පවතින ගිණුම්වල ඔබින් ද බැඳී සිටිමට ගනුදෙනුකරු එකඟ වෙයි.

අර්ථනිරූපනා

මෙම පොදු නීතිරීති හා කොන්දේසි වල ඒකවචන වලින් දැක්වෙන වචන වලට බහුවචන ද ඇතුළත් වන අතර, එය අනෙක් අතට ද වලංගු වේ. පුරුෂලිංග අර්ථ දක්වන වචන ඔබින් ස්ත්‍රීලිංග වචන ද අදහස් වන අතර, පුද්ගලයන් හැඟවෙන වචන ඔබින් සංස්ථා සහ සමාගම් ද අදහස් වේ. මෙහි ශීර්ෂය යටතුළත් කර ඇත්නේ පහතුව සඳහා පමණක් වන අතර, ඒවා මෙම ලේඛනය අර්ථනිරූපනයේ දී බලපෑමක් නොකරයි.යම් ව්‍යවස්ථාවක ප්‍රතිපාදනයක්, රෙගුලාසියක්, රීතියක්, නියෝගයක් හෝ නියමයක් සම්බන්ධයෙන් සඳහන් කිරීම වලට එම ප්‍රතිපාදනය, රෙගුලාසිය, රීතිය, නියෝගය හෝ නියමයට කලින් කලට සිදුකරන නැවත පැනවීම, සංශෝධන, ඊත්ත කිරීම, අතිරේක එකතු කිරීම හෝ විතැන් කිරීම ද ඇතුළත් වනු ඇත.

2. බැංකු ගිණුම

ගනුදෙනුකාර විසින් වෙනත් ආකාරයකට බැංකුව වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකරන තෙක්, පහත කාර්යයන් සඳහා ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍රයේ (ඉන් මතුවට මෙහි 'මැන්ඩේට් පත්‍රය' යනුවෙන් හැඳින්වෙනු ඇත)ලබා දී ඇති මෙහෙයුම් උපදෙස් වලට අනුකූලව සකසන ලද හෝ පිළිගන්නා ලද ලිඛිත උපදෙස් හෝ අත්සන් කළ ලිඛිත ලේඛනයක් මත ක්‍රියා කිරීමට බැංකුවට අවසර පවතින බවට මෙමගින් එකඟ වේ.

(a) චෙක්පත්, වීනිමය බිල්පත්, පොරොන්දු නෝට්පු, ස්ථාවර තියෙග්න, සෘජු භර මත ගෙවීම් සිදුකිරීම සඳහා, බැංකු ඇණවුම්, තැපෑල් හා පොලිගාර් මාරුකිරීම් නිකුත් කිරීම, සුරැකුම් හා විමේධාවපාවත් මුදල් මිලදී ගැනීම හා අලවම් කිරීම සඳහා සහ, බැර ලෙස හෝ වෙනත් ආකාරයකින් පවතින ගිණුමක් හර කරනු ලබන වෙනත් ඕනෑම උපදෙසක් ක්‍රියාත්මක කරවීම සඳහා; සහ

(b) ගිණුමක් වසාදැමීම ද ඇතුළත්ව ගිණුමක් සම්බන්ධයෙන් වෙනත් ඕනෑම උපදෙසක් පිළිගැනීමට.

3. චෙක්පොත්

(a) බැංකුව විසින් සිය පූර්ණ අභිමතය පරිදි ජංගම ගිණුමක් සඳහා චෙක්පොතක් නිකුත් කළ හැකිය. චෙක්පොතක් නිකුත් කර ඇති ඊට සෑම අවස්ථාවකම එය ආරක්ෂිතව තබාගැනීම සම්බන්ධයෙන් හා, එම චෙක්පොත හෝ එහි අන්තර්ගත කිසියම් චෙක්පතක් නැතිවූ හෝ සොරකම් කළ විට ඒ බව වහාම බැංකුව වෙත දැනුම්දීමට ද ගනුදෙනුකරු වගකිව යුතු වේ.

(b) ගනුදෙනුකරු වෙතින් චෙක්පොත හෝ චෙක්පතක් නැතිවූ අවස්ථාවක බැංකුව විසින් සිය පූර්ණ අභිමතය පරිදි චෙක්පත් වල ගෙවීම් නැවැත්වීම සඳහා ගනුදෙනුකරු විසින් ලබාදෙන (වාචික හෝ ලිඛිත) උපදෙස් සිදුවනු ඇත. වාචිකව සිදුකරන ඕනෑම ඉල්ලීමකට පසුව එදිනම ඒ බව ලිඛිතව තහවුරු කළ යුතු වේ.

(c) අධිකව චෙක්පත් අගරු වන්නේ නම් චෙක්පොත් නිකුත් නොකර සිටීමට බැංකුව විසින් අයිතිය රඳවාගනියි.

4. අයිරා

(a) කිසියම් අයිරාවක් හෝ බැංකුවේ පවතින ගිණුම් සම්බන්ධයෙන් පැන නගින වෙනත් පහසුකම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු වන අතර, සමස්ත පොලී මුදල් හෝ ඉන් කොටසක් (දැඩ පොලී ද ඇතුළත්ව), ඒ සම්බන්ධයෙන් දරන්නට සිදුවන කොමිස් මුදල් සහ වෙනත් බැංකු ගාස්තු, පිරිවැය හා පියදම් (නීතිමය පිරිවැය ද ඇතුළත්ව) බැංකුව විසින් කලින් කලට ස්ථිතිය පූර්ණ අභිමතය පරිදි තීරණය කරනු ලබන අනුපාතයන් මත යම් ගිණුම්කින් හර කිරීමට ගනුදෙනුකරු මෙමගින් විශේෂිතවම බැංකුව වෙත අවසර දී සිටිමි.එම මුදල් ප්‍රමාණයන්, බැංකුව විසින් සිය පූර්ණ අභිමතය පරිදි ඉල්ලා සිටින ආකාරයකින්, ඉල්ලා සිටින අවස්ථාවන්හි ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතුය.

(b) බැංකු අයිරා හෝ ඊට සම්බන්ධ වෙනත් බැංකු පහසුකමක් බලාත්මකව පවතින අවස්ථාවක යම් මුදල් ප්‍රමාණයක් යම් ගිණුමකට බැර කරන අද අවස්ථාවක, යම් මග පොලී මුදල් සම්පූර්ණයෙන් වෙවන තෙක් බැංකුව විසින් එම මුදල් සලකුමෙන් ගෙවිය යුතුව පවතින යම් පොලී මුදලක් (දැඩ පොලී ද ඇතුළත්ව) පියවීම සඳහා බැංකුව විසින් යොදවනු ඇත. ඉන් පසුව, එසේ බැර කරන ලද යම් මුදලක් එම අයිරා හෝ වෙනත් බැංකු පහසුකමක මුලික මුදල පියවීම සඳහා යෙදවෙනු ඇත.

5. තැන්පතු සහ ආපසු ගැනීම

තැන්පතු සහ ආපසු ගැනීම වර්තමානයේ ශ්‍රී ලංකාවේ බලාත්මකව පවතින නීති මගින් පාලනය වනු ඇත. බැංකුවට සෘජුවකින් පසුවිය හැකි පරිදි අනතුරුතාවය පිළිබඳ සෘජුමේ ඉදිරිපත් කිරීමට යටත්ව සහ බැංකුව විසින් කලින් කලට අයකරනු ලබන ගනුදෙනු ගාස්තුවලට යටත්ව, ශ්‍රී ලංකාවේ ඕනෑම ශාඛාවකින් මුදල් ආපසු ගැනීමට අවසර දීමට බැංකුවට අභිමතය පවතී. කිසිවෙකුගේ, ඉවතලන්නාගේ, මුහුණු ආවරණ පාදුම්මේ වැනි හේතු ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී යම් හේතුවක් මත ගනුදෙනුකරුගේ අනන්‍යතාව තහවුරු කරගැනීමට බැංකුවට නොහැකි වුවහොත් ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා ඉවත් කිරීමට ගනුදෙනුකරු එකඟ වේ.

6. ගිණුම් පවත්වාගෙන යාම

(a) කාලාන්තර ශේෂ ප්‍රකාශන

වෙනත් ආකාරයකින් එකඟ වී නොමැති නම්, බැංකුව විසින් ගනුදෙනුකරුගේ ගිණුම් සම්බන්ධයෙන් බැංකුව විසින් තීරණය කරනු ලබන කාලාන්තරයන්හි, කාලාන්තර ශේෂ ප්‍රකාශන නිකුත් කරනු ඇත.

(b) විරෝධතා සඳහා වේදී ඇති කාලය

ගනුදෙනුකරුවෙකු වන ලැබෙන යම් කාලාන්තර ශේෂ ප්‍රකාශනයන් හි නිවැරදි භාවය හෝ අසම්පූර්ණ භාවය හෝ සම්බන්ධයෙන් ගනුදෙනුකරුට පවතින යම් විරෝධතාවක් වහාම ඉදිරිත් කළයුතු වන අතර, කෙසේ වුවද එම ප්‍රකාශනය ලද දවසක සිට විරෝධතා ලිඛිතව බැංකුව වෙත ලැබිය යුතු වේ, මෙහත දක්වා ඇති කාලසීමාව තුළ කිසිදු විරෝධතාවක් ඉදිරිත් කර නොමැති නම්, එම කාලාන්තර ප්‍රකාශනය නිවැරදි සහ බන්ධනීය ලෙස සැලකෙනු ඇත.

7. හවුල් ගිණුම් හා හවුල්කාරීත්ව ගිණුම්

(a) ගනුදෙනුකරුගේ ගිණුමක් හවුල් ගිණුමක් වුවහොත් එවිට සියලු පොලී මුදල්, කොමිස් සහ වෙනත් බැංකු ගාස්තු සහ විදයම් ද ඇතුළත්ව එම ගිණුම මත පිරිනමා ඇති කිසියම් අයිරාවක්, ණය මුදලක් හෝ වෙනත් ණය පහසුකමක් හෝ ඉඩ සැලසීමක් සඳහා හවුල් ගිණුම හිමියන් එක්ව හා වෙන්වෙන්වා වගකිව යුතු වනු ඇත.

(b) හවුල් ගිණුම් හිමියන් අතරින් එක් අයෙකු හෝ වැඩි ගණනක් මිය ගියහොත්, එවැනි අවස්ථාවක බැංකුව වෙත පැවති හෝ හවුල් ගිණුම් හිමියාගේ නමින් පවතින යම් ගිණුමක බැරිව පවතින සියලු මුදල්, සුරක්ෂිත, ඔත්තු, ලේඛන සහ වෙනත් දේපළ (ආරක්ෂිත තැන්පතු පෙට්ටියක සහ වෙනත් අන්තර්ගතයන් ද ඇතුළත්ව), සහේ මියගිය හවුල් ගිණුම් හිමියා (ගිමියන්ගේ නිහාසානුතුල උරුමකරුවන් හෝ නෙනතික නියෝජිතයන් වෙත යොමු කිරීමකින් තොරව ඉතිරිව සිටින ගිණුම් හිමියා හෝ ගිණුම් හිමියන් වෙත හෝ හවුල්කාර නියමය පරිදි බැංකුව විසින් භාරගෙනු ඇත.

(c) හවුල් ගිණුම් හිමියන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකුගේ මරණය සම්බන්ධව දැන්වීමක් ලැබීමෙන් පසුව සහ බැංකුව වෙත පැවති හෝ හවුල් ගිණුම් හිමියාගේ නමින් පවතින ඕනෑම ආකාරයක ගිණුමක බැරිව පවතින සියලු මුදල්, සුරක්ෂිත, ඔත්තු, ලේඛන සහ වෙනත් දේපළ ඉතිරිව සිටින ගිණුම් හිමියා හෝ ගිණුම් හිමියන් වෙත හෝ හවුල්කාර නියමය පරිදි ගෙවීමෙන් හෝ භාරදීමෙන් පසුව, හවුල් ගිණුම් හිමියන් වෙත බැංකුවට පවතින සියලුම බැඳීම් වලින් බැංකුව සම්පූර්ණයෙන්ම නිදාගත් වනු ඇත.

8. ඉතිරිකිරීමේ ගිණුම් සඳහා නිතිරීති හා කොන්දේසි

(a) බැංකුවේ ඕනෑම ශාඛාවක දී තැන්පත් කිරීම සිදුකළ හැක.

(b) මෙම නීතිරීති හා කොන්දේසි වලට යටත්ව බැංකුවේ ඕනෑම ශාඛාවක දී ආපසු ගැනීම ද සිදුකළ හැක.

(c) නියමිත අවම ශේෂයෙට අඩු ශේෂයක් පවතින සහ තවද මාස 12කට වැඩි කාලසීමාවක් අක්‍රියව පවතින ගිණුම්වල බැංකුව විසින් වසා දැමීය හැකිය.

(d) චෙක්පත්/ඇණවුම් සහ මුදල් අණකර ඉතිරිකිරීමේ ගිණුම් වල බැරව භාරගනු ලබන්නේ බැංකුවේ පූර්ණ අභිමතයට අනුව පමණි.

(e) ගණනය කරනු ලබන සෑම දිනකම ගිණුමෙහි නියමිත අවම ශේෂය පැවතීමට යටත්ව, දෛනික ශේෂය මත පොලිය ගණනය කර මාසිකව බැර කරනු ඇත.

(f) සාමාන්‍යයෙන් ගිණුම් වාර්තා ක්‍රමයේ ලෙස විදයුත් ගිණුම් ප්‍රකාශන ලැබීමට ඉතිරිකිරීමේ ගිණුම් හිමියන් ලියාපදිංචි කරනු ලැබේ. කෙසේ වුවද, ගනුදෙනුකරුගේ ඉල්ලීම මත, බැංකුව විසින් ඒ සඳහා පාස්පොතක් නිකුත් කළ හැකිය.පාස්පොතෙහි ආරක්ෂාව සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු වේ.පාස්පොත නැති වුවහොත්, සොරකම් කළහොත් හෝ අස්වාභාවික වුවහොත් එවිට ප්‍රමාදයකින් තොරව ලිඛිතව බැංකුව වෙත දැනුම්දිය යුතු වේ.

(g) බැංකු පොත කවුන්ටරය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් අදාළ අවස්ථාවන්හි තැන්පත් කරන ලද හෝ ආපසු ගන්නා ලද මුදල් සම්බන්ධව බැංකුව විසින් බැංකු පොතෙහි සටහන් කරනු ඇත. ගිණුම් හිමියෙකු විසින් බැංකුවෙන් පිටව යාමට පෙර ඕනෑමේ බැංකු පොතෙහි ඇතුළත් කිරීම සැලකිල්ලෙන් පරීක්ෂා කර බලා රහි ඇතුළත් කිරීම නිවැරදි බවට සෘජුමයට පත්විය යුතු වේ. සිසියම් පරස්පරතාවක් ඇත්නම් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

(h) සියලු ගනුදෙනු සටහන් කිරීම සඳහා අවම වශයෙන් සෑම මාස හය (06)කට වරක් වත් බැංකු පොත ඉදිරිපත් කළ යුතු වේ. බැංකු පොත ඉදිරිපත් කරනු ලබන දිනයධ වසර තුන (03)ක ට වෙර සිදුකරන දෙද ගනුදෙනු බැංකු පොතෙහි වාර්තාගත කිරීමට නොපවතිනු ඇත. ව්‍යවස්ථාපිතව නිගම කර ඇති කාලසීමාව ඉක්මවා ගොස් ඇති ගනුදෙනු වාර්තා කිරීම සඳහා බැංකුව විසින් වාර්තා පවත්වා ගනු නොලැබේ.

(i) බැංකු පොතෙහි වාර්තාගත කර නොමැති ගනුදෙනු පිළිබඳ ප්‍රකාශනය බැංකුව විසින් සිය අභිමතය පරිදි සාමාන්‍යය තැපෑලෙන් තැපෑල් කිරීමට අයිතිය රඳවා ගනියි.

(j) ගිණුම් හිමියා විසින් ඉදලින් සැකරන ආපසු ගැනීම් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ඉන් මතුවට ATM යන්ත්‍ර) මගින් සිදුකළ හැකි අතර, තාත්තහොත් බැංකු පොත සහ නිවැරදි ලෙස සම්පූර්ණ කළ මුදල් ආපසු ගැනීමේ ආකෘතිපත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් කවුන්ටරයේදී සිදුකළ හැකිය. කවුන්ටරයේදී මුදල් ආපසු ගැනීමක් සිදුකිරීමේදී ඉතිරිකිරීමේ ගිණුම් හිමියා විසින් නිවැරදි ලෙස සම්පූර්ණ කළ මුදල් ආපසු ගැනීමේ ආකෘතිපත්‍රය සමග ස්ථිතිය බැංකු පොත සහ ජාතික හැඳුනුම්පත/ විදයුත් හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු වේ.

(k) ATM යන්ත්‍රයක් මගින් සිදුකරන ගනුදෙනුවක් එම යන්ත්‍ර භාවිතයට අදාළ නීතිරීති හා කොන්දේසි වලට ද යටත් වේ.

(l) අදාළ සැලසුමට අයත් විශේෂාංග වලට විය යුතු වන ආකාරයට ඉතිරිකිරීමේ ගිණුම් වලට පොලිය උපචිත වනු ඇත. විශයගත ශේෂයන් පවත්වාගෙන නොයන අවස්ථාවල දී, අදාළ ශේෂයන් දක්වා ශේෂයන් ඉහළ දැමීම සිදුකරන තෙක් ගිණුමට කිසිදු පොලියක් උපචිත නොවනු ඇත.

9. ජංගම ගිණුම් සඳහා නිතිරීති හා කොන්දේසි

(a) බැංකුවේ ව්‍යාපාරික වේලාවන් DFCC බැංකුවේ අදාළ ශාඛාවන් විසින් ප්‍රකාශයට පත් කරනු ඇත.

(b) ජංගම ගිණුමක පවතින යම් ශේෂයක් සඳහා පොලී ගෙවනු නොලැබේ.

(c) ජංගම ගිණුම් සඳහා නාමික ගෙවීමක් මත චෙක්පොතක් සපයනු ලැබේ.

(d) කෙසේ වුවද ශ්‍රී ලංකා රජය විසින් සහ නිශ්කාශන නිවස(Clearing House) විසින් අය කරනු ලබන බදු සහ වෙනත් ගාස්තු ජංගම ගිණුමට හර කරනු ලැබේ.

(e) චෙක්පත් භාවිත කිරීමේදී පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් දැක්විය යුතු වේ.

I. අනවසර පුද්ගලයන්ට චෙක්පොත වෙත ප්‍රවේශ වීමට ඉඩ නොතැබිය යුතුය.

II. ගනුදෙනුකරු වෙත නිකුත් කරන ලද චෙක්පොතක ආරක්ෂාව කරුණිම සම්බන්ධයෙන් ගනුදෙනුකරුගේ නොසැලකිලිල සේතුවෙන් අත්තනන් පාවිච්චි වීම මත චෙක්පතකට අගරු කළහොත්, ඒ සම්බන්ධයෙන් බැංකුව වගකිමට ලක් නොකළ යුතුය.

III. චෙක්පත් නිකුත් කිරීමේදී එය ලියනු ලබන මුදල ඉලක්කමෙන් හා අකුරින් පැහැදිලිව ලිවිය යුතු වන අතර අදාළ පරිදි යම් ඉලක්කමක් හෝ පසුව වඩනක් හෝ එකතු කළ හැකි වන ආකාරයෙන් කිසිදු ඉඩක් ඉතිරිකර නොතැබිය යුතු වේ.

IV. චෙක්පතක් මත කිසියම් වෙනස් කිරීමක් සිදුකළ යුතු වන්නේ, නම් එම වෙනස් කිරීම චෙක්පත් හිමියාගේ සම්පූර්ණ අත්සන යොදා සහතික කළ යුතු වේ.

V. ගෙවීම් සඳහා චෙක්පත ඉදිරිපත් කරනු ලබන දින සිට මාස හයකට (06) පෙර දිනයක් දරන යම් චෙක්පතක් සඳහා ගෙවීම් සිදුකිරීමට බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

VI. පසු-දාතම යෙදූ කිසියම් චෙක්පතකට ප්‍රමාද දෝෂයකින් මුදල් ගෙවා ගනුදෙනුකරුගේ ගිණුම හර කරනු ලැබුවහොත්, ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ. පසු-දාතම යෙදූ චෙක්පතක් යනු එය ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන දිනයට පසු දිනයක දාතම යොදා ඇති චෙක්පතකි.

VII. උපලබ්ධි නොවූ මුදල් සඳහා චෙක්පතකට ගෙවීමට බැංකුව බැඳී නොසිටී.

VIII. ගනුදෙනුකරුවෙකු වෙත නිකුත් කළ චෙක්පතක් හෝ චෙක්පොතක් නැති වුවහොත් ඒ බව බැංකුව වෙත ලිඛිතව වහාම දැනුම් දිය යුතු වේ.

(f) ගනුදෙනුකරුවෙකු ගිණුමකට මුදල් තැන්පත් කරන විට, එම කාර්යය සඳහා සපයා ඇති බැංකුමුදල් මුදල් තැන්පතු යන්ත්‍රය මගින් මුදලය කරනු ලබන්නේ නම් හැර, අදාළ අනුපිටපතෙහි හෝ පිසිටපතෙහි බැංකුවේ නිලධාරියෙකුගේ අත්සන සහ බැංකු මුද්‍රාව තබාගත යුතු වේ.

(g) ගිණුමකින් මුදල් ආපසු ගන්නා ගනුදෙනුකරුවෙකු, බැංකුව සමග පූර්ව සූදානමක් නොමැතිව පවතින ශේෂයට වඩා අධිකව මුදල් ආපසු නොගත යුතුය. කෙසේ වුවද, අදාළ දිනයේ දී ඔහුගේ ගිණුමෙහි පවතින නිශ්කාශනය කළ ශේෂයට අතිරික්තයට ගෙවන ලද මුදල සම්බන්ධයෙන් අදාළ අනුපාතයකට පොලී ගෙවීමට ගනුදෙනුකරු බැඳී සිටියි.

(h) ගනුදෙනුකරුවෙකු විසින් වැඩිදුර චෙක්පත් නිකුත් කිරීම සඳහා පවතින ශේෂය නිශ්චය කරගැනීමේදී නිකුත් කර ඇති නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති සියලුම චෙක්පත් සලකා බැලිය යුතු වේ.

(i) ගනුදෙනුකරුවෙකු විසින් ඉල්ලා සිටින පරිදි යම් කාලාන්තරයකින් එක් එක් ජංගම ගිණුම් හිමියෙකු වෙත බැංකුව විසින් ගිණුම් ප්‍රකාශනයක් සපයනු ඇති අතර, නැතහොත් ගනුදෙනුකරු වෙතින් එවැනි ඉල්ලීමක් නොමැති විට බැංකුව විසින් තීරණය කරනු ලබන කාලාන්තරයන්හි දී ගිණුම් ප්‍රකාශනය යවනු ඇත. ගිණුම් ප්‍රකාශනය ලැබුණු පසුව සැලකිල්ලෙන් පරීක්ෂා කර බැලිය යුතු අතර, එහි යම් පරස්පරතාවක් පැවතියහොත් ඒ බව වහාම බැංකුවේ අවධානයට යොමු කළ යුතු වේ.

(j) අදාළ අවස්ථාවන්හි දී බැංකුව විසින් සපයන සේවාවන් සඳහා කොමිස් මුදල් අයකරනු ඇත, තවද අගරු වන සෑම චෙක්පතක සඳහා ද මෙන් ගිණුම් හිමියා විසින් අත්හිටුවන ලද සෑම ගෙවීමක් සඳහා ම බැංකුව විසින් ගාස්තුවක් පනවනු ඇත.

(k) යම් ගෙවීමක් නැවැත්වීමට ගිණුම් හිමියා වෙතින් ලැබෙන උපදෙස් බැංකුව විසින් වාර්තාගත කරනු ලැබේ. කෙසේ වුවද, එවැනි උපදෙස් ඇතුළත්කය කිරීමට බැංකුව අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් බැංකුව වගකීමට ලක් නොවනු ඇත.

(l) චෙක්පත් අගරු වීම යම් නිශ්චිත සංඛ්‍යාවක් ඉක්මවන්නේ නම්, බැංකුව විසින් ගිණුම වසා දමනු ඇති අතර, එම සංඛ්‍යාව බැංකුව විසින් කලින් කලට ප්‍රකාශ කරනු ඇත.

10. තැන්පතු ගිණුම් සඳහා නිතිරීති හා කොන්දේසි

(a) තැන්පතුව, මුදල් තැන්පතුවක් හෝ අයුත් කළ තැන්පතුවක් වුවද එම තැන්පතුවෙහි කාලසීමාව තුළ තැන්පතුවක් හෝ ඉන් කොටසක් හෝ තැන්පතුකරුවෙකු වෙත නිකුත් කිරීමට බැංකුව සිසිදු වගකීමකට බැඳී නොමැත.

(b) තැන්පතුවක් සිදුකරනු ලබන අවස්ථාවේදී බැංකුව විසින් තැන්පතුකරුවෙකු වෙත නිකුත් කරන ලද වාර තැන්පතු සහතිකයක්/ලදුපතක් හුවමාරු කළ නොහැක.

(c) තැන්පතුව, මුදල් තැන්පතුවක් හෝ අයුත් කළ තැන්පතුවක් වුවද එම තැන්පතුවෙහි කාලය හෝ කාලසීමාව කල්පිරීම සහ නිසි ලෙස නිදාගත් කළ සහතිකය බැංකුව වෙත භාරදීම එම වාර තැන්පතුවේ ඇති මුදල් නිදහස් කිරීම සඳහා පූර්ව කොන්දේසි වේ. සිසියම් වාර තැන්පතුවක පවතින මුදල් නිදාගත් කිරීම සඳහා තැන්පතු ලදුපත බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ.

(d) ගනුදෙනුකරු විසින් ඕට පරස්පර ලෙස උපදෙස් බැංකුව වෙත ලබාදුනහොත් හැර තැන්පතුව කල්පිරෙන දිනයේදී මුලික මුදල සහ එකතු වූ පොලිය මුල් තැන්පතුවට සමාන කාලසීමාවක් සඳහා නැවත යෙදවෙනු ඇත.

(e) තැන්පතුවක වර්තමාන කාලසීමාව අවසන් වීමට අවම වශයෙන් වැඩකරන දින හත (07) කට පෙර තැන්පතුකරු විසින් ඕට පවහැති ලෙස ලිඛිතව බැංකුව වෙත උපදෙස් දුනහොත් හැර, එසේ ක්‍රියා කිරීමට බැංකුව බැඳී නොසිටියද වාර තැන්පතුව,එහි පොලිය එකතු වී ඇත්නම් එය ද සමග බැංකුවේ අභිමතය පරිදි මෙහි අඩංගු නිතිරීති හා කොන්දේසි වලට යටත්ව හෝ බැංකුව විසින් අවශ්‍ය යැයි සලකනු ඇති වෙනත් යම් ආකාරයක වැඩිදුර කොන්දේසි වලට යටත්ව හෝ වැඩිදුර කාලසීමාවක් සඳහා අයුත් කිරීමට බැංකුවට අයිතිය සහ බලය පවතී.

11. බැංකු සේවාවන්හි පිරිවැය

(a) පොලිය සහ අයකිරීම

බැංකුව සමග ලිඛිතව එකඟ වන පරිදි හෝ එවැනි එකඟතාවක් නොපවතින විට හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන ආකාරයකට, යම් අනුපාතයකට යම් පදනමක් මත යම් කාලයකදී බැංකුව වෙත ගෙවිය යුතුව පවතින මුදල් මත පොලී සහ බැංකුව විසින් සපයනු ලබන සේවාවන් සඳහා සිදුකරන අයකිරීම් ගනුදෙනුකරු විසින් ගෙවිය යුතුය.

(b) අයිරා වූ මුදල් සඳහා පොලී

බැංකුවට ස්ථිතිය අභිමතය පරිදි ගෙවිය යුතුව පවතින විට ගෙවා නොමැති මුදල් මත හෝ පූර්ව එකඟතාවක් නොමැතිව අයිරා වූ මුදල් මතඉහළ පොලියක් අය කිරීමට ගිණිකම පවතින අතර, එම පොලිය කලින් කලට බැංකුව විසින් තීරණය කරන පරිදි එකාබද්ධ කරනු ලැබිය හැකිය.

(c) පොලිය සහ ගාස්තු වෙනස් කිරීම

විවෘත පොළී අනුපාත පහසුකමක් සම්බන්ධයෙන් නම්, අදාළ ගිවිසුමෙහි කොන්දේසි වලට අනුකූලව පොළී අනුපාතය සකස් කෙරෙනු ඇත, වෙනත් ආකාරයකට ලිඛිතව එකඟ වී නොමැති නම්, බැංකුව විසින් ස්වාසිය සාධාරණ අභිමතය පරිදි සේවාවන් සඳහා අයකිරීම වෙනස් කළ හැකිය.

(d) පිරිවැය සහ වියදම්

පෙරකුළුව ගනුදෙනුකරු වෙත දක්වා ඇතත් හෝ නැතත්, සියලුම කොමිස් මුදල් සහ බැංකුව විසින් සාමාන්‍යයෙන් අයකරනු ලබන වෙනත් ගාස්තු සහ, බැංකුව හා ගනුදෙනුකරු අතර ඇතිකරගන්නා ලද මෙම පොදු කොන්දේසි යටතේ, වෙනත් විශේෂ කොන්දේසි යටතේ හෝ වෙනත් ගිවිසුමක් යටතේ බැංකුව විසින් දරන ලද වෙනත් සියලු පිරිවැය, අයකිරීම් සහ පොරගැසීකම් වියදම් කළ මුදල් සහ වෙනත් වියදම් ද නිතිමය වියදම් ද ඇතුළත්ව, ඉල්ලූ විට ගනුදෙනුකරු විසින් වහාම බැංකුව වෙත ගෙවා ප්‍රතිපූරණය කළ යුතු අතර, ඒ සඳහා බැංකුවට ගනුදෙනුකරුගේ ගිණුම් හර කිරීමට ගිණිකම පවතී.

(e) බදු සහ වෙනත් අයකිරීම්

බැංකුව විසින් ගනුදෙනුකරු සමඟ සිදුකරන ලද ගනුදෙනු මත සියලුම පිරිවැයුම් බදු, ජාතික ආරක්ෂක බද්ද, භාණ්ඩ හා සේවා බදු හෝ ඊට සමාන වෙනත් පිරිවැයුම් පදනම් කරගත් බදු, මුද්‍රද්‍ර ගාස්තු හෝ අදාළ වන්නේ නම් වෙනත් අයකිරීම් ද බැංකුව වෙත ගෙවීමට ගනුදෙනුකරු වගකිමට බැඳී සිටියි.

12. විදේශ ව්‍යවහාර මුදල් ගිණුම/ ගනුදෙනු

(a) විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (ගිණුම) විවෘත කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහ/හෝ ඊට සමාන අධිකාරීයක් විසින් කලින් කලට නියම කර ඇති පරිදි විශේෂිත ලිපි ලේඛන අවශ්‍ය වනු ඇත. එසේ අවශ්‍ය කෙරෙන විශේෂිත ලිපි ලේඛන බැංකුවේ ගිණුම විවෘත කිරීමට පෙර ගනුදෙනුකරු විසින් සැපයිය යුතු වේ.

(b) සංචාරක චෙක්පත්, විදේශ ව්‍යවහාර මුදල් කෙටිවනු, බැහැරයන ප්‍රේෂණ සහ ලැබෙන ප්‍රේෂණ කිසියම් ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට, ඉදිරි ඇණවුම් ගනුදෙනු හා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ද ඇතුළත්ව විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවකට නිතුත් කිරීම සාමාන්‍යයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහ/හෝ ඊට සමාන අධිකාරීයක චක්‍රලේඛයක් මගින් පාලනය වන අතර, එය පූර්ව දැනුම්දීමකින් තොරව කලින් කලට වෙනස් වීමට ඉඩ ඇති අතර, ඒ සම්බන්ධයෙන් බැංකුව බැඳීමකට හෝ වගකීමකට ලක් නොවනු ඇත.

(c) විදේශ ව්‍යවහාර මුදල් වලින් පවත්වාගෙන යන කිසියම් ගිණුමකට (ගිණුම් වලට) සහ/හෝ ඉදිරි ඇණවුම් ගනුදෙනු ද ඇතුළත් විදේශ විනිමය ගනුදෙනුවකට අදාළ වන අවදානමක් සම්බන්ධයෙන් මුදලෙන්ම ගනුදෙනුකරු එවැනි ගිණුම් සම්බන්ධයෙන් සහ/හෝ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ජාත්‍යන්තර හෝ දේශීය නීතිමය හෝ නියාමන සීමාකිරීමක් මගින් උද්ගත වන දෑ ද ඇතුළත්ව ඊට සීමා නොවී එමගින් යම් ආකාරයකින් උද්ගත වන සියලු අවදානම සහ පිරිවැය ද වියදම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු බවට පිළිගන්නා අතර, එවැනි බැංකු ගනුදෙනු මගින් උද්ගත වන ඕනෑම හානියක් හෝ පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව හානිපූරණය කළ යුතුය. එවැනි යම් ගිණුමක් (ගිණුම්) මගින් මුදල් සපයා ගැනීම හෝ ගනුදෙනු කිරීම අදාළ මුදල් වර්ගය බැංකුවේ අදාළ ශාඛාවේ ලබාගැනීමට පැවතීමේ ද යටත් වේ, එක් මුදල් වර්ගයකින් වෙනත් මුදල් වර්ගයකට පරිවර්තනය කිරීම බැංකුව විසින් (සිය පූර්ණ අභිමතය පරිදි) කලින් කලට තීරණය කරනු ලබන විනිමය අනුපාතය මත සිදුකෙරෙනු ඇත.

13. පැමිණිලි හැසිරවීම

බැංකුවේ වෙබ් අඩවියෙහි හෝ වෙනත් නිල ප්‍රකාශනයක හෝ බැංකුවේ දැන්වීමක් මගින් ප්‍රකාශයට පත්කර ඇති පරිදි බැංකුවේ උසාවි ඇති ශාඛාවට හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ ලිඛිතව හෝ බැංකුව වෙත පැමිණිලිරැස් ඉදිරිපත් කිරීමේ අයිතිය ගනුදෙනුකරුට පවතිනු ඇත. පැමිණිල්ලක් ලැබීමේ පසු එය ලද තැනැත්තා විසින් විමර්ශනය හා වැඩිදුර පියවර සඳහා එම පැමිණිල්ල බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුව හෝ අංශය වෙත ඉදිරිපත් කරනු ඇත. බැංකුවේ පාරිභෝගික අත්දැකීම් ඒකකය විසින් එම සියලු පැමිණිලි නිරීක්ෂණය කර නිසි ලෙස පසුවිපරමින් සිදුකරනු ඇත. සිදුකරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් බැංකුව විසින් එම පැමිණිල්ල ලද දිනයේ සිට සාධාරණ කාලසීමාවක් තුළ ගනුදෙනුකරු වෙත ප්‍රතිචාර දක්වනු ඇත. එම කාලසීමාව තුළ පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනය අවශ්‍ය කිරීමට බැංකුවට නොහැකි වුවහොත්, එවිට පැමිණිල්ලට අවසන් ප්‍රතිචාරයක් ලබාදෙන තෙක් බැංකුව විසින් එක කාලසීමාව තුළ ගනුදෙනුකරු වෙත අත්තිරන්කැලීම ප්‍රතිචාරයක් ලබාදෙනු ඇත. පැමිණිලිරැස සාධාරණ බවට බැංකුව සෑහීමකට පත් වන්නේ නම්, එවිට එම පැමිණිල්ල විසඳීමට ගන්නා ලද පියවර සම්බන්ධයෙන් බැංකුව විසින් අවසාන ප්‍රතිචාරයක් මගින් ගනුදෙනුකරු වෙත දන්වා සිටිනු ඇත. තමන් සෑහීමකට පත්වන ආකාරයෙන් පැමිණිල්ලක් විසඳා නොමැති නම්, මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හෝ අධිකරණය හරහා සෘජුව ලබාගැනීමට හැකි බවට ගනුදෙනුකරුවන් වෙත උපදෙස් දී සිටිමු.

14. මරණය, අගතිතුනාවය හෝ ඛුන්වත් භාවය

ගනුදෙනුකරුගේ මරණය, අගතිතුනාවය හෝ ඛුන්වත් භාවය සිදුවූ විට, ගනුදෙනුකරුවාගේ හෝ මියයිය කැනැත්තාගේ පොල්මහතැර, අල්මිනිස්තුනිකරු හෝ වෙනත් පොදුරැකිනා නියෝජිතයෙකු පෙනී සිටිය යුතු තැනැත්තෙකු සහ වත්තුම වල භාරකරුවෙකු හෝ ලැබුම්කරුවෙකු හෝ වත්තුම වල උද්දේශිත අප්ලාභියෙකු වෙත හෝ විසින් ආපසු ගැනීමට/අවසනු කිරීමට/නිදහස් කිරීමට බැංකුව විසින් අවසර දීමට පෙර, ඒ සම්බන්ධයෙන් බැංකුවට පිළිගත හැකි ආකාරයකින් හා අත්තිරන්කැලෙන් යුක්ත ලේඛනගත සාක්ෂි (මරණ සහතිකය, අල්මිනිස්තුනි බලපත්‍රය, පොමෝට බලපත්‍රය අදාළ අධිකරණ ලේඛන හෝ ඊට සමාන වෙනත් යම් අදාළ ලේඛනයක්) ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට බැංකුවට හිමිකම පවතී. බැංකුව විසින් ඉල්ලා සිටින්නේ නම්, යම් ලේඛනගත සාක්ෂියක මුල් පිටපත බැංකුවට පිළිගත හැකි එහි ඉංග්‍රීසි පරිවර්තනයක් (අදාළ අවස්ථාවන්හි) ද සමඟ ඉදිරිපත් කළ යුතු වේ. යම් ගිණුම් හිමියෙකුගේ මරණය, අගතිතුනාවය හෝ ඛුන්වත් භාවය සම්බන්ධයෙන් විස්වාසනීය දෙය සැලකෙන මූලාශ්‍රයක් වෙතින් ඒ බවට ලිඛිත දැනුම්දීමක් බැංකුව වෙත ලැබෙන තෙක් එමගින් බැංකුව බැඳීමකට ලක් නොවේ. අදාළ දැනුම්දීම ලැබුණු පසු, ඒ සම්බන්ධයෙන් ඉහත සඳහන් කර ඇති පරිදි බැංකුවට සෑහීමකට පත්වීය හැකි ලෙස සාක්ෂි ලැබෙන තෙක් අදාළ ගිණුම (ගිණුම්) අත්තිරුවීමට බැංකුවට හිමිකම පවතියි.

15. විදේශ ව්‍යවහාර මුදල් පිළිබඳ අවදානම හෙජිදරව් කිරීම

විදේශ ව්‍යවහාර මුදල් අයෝජනයන් සමඟ බැඳුණු පාඩු පිළිබඳ අවදානම සම්බන්ධයෙන් ගනුදෙනුකරු සම්පූර්ණයෙන් දැනුවත්ව සිටින බවට ද, ඊට සම්බන්ධ ඕලාභය හා වෙනත් අවදානම් භාරගැනීමට කැමැත්තෙන් සිටින බව සහ ඊට හානියාව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ගනුදෙනුකරුට විඳින්නට සිදුවිය හැකි එවැනි පාඩු සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් කිසිදු ආකාරයකින් බැංකුව වගකීමට ලක් නොකරන බවට ද ගනුදෙනුකරු මෙමගින් ප්‍රකාශ කර සිටියි.

16. පියවීම සහ කැපබලය

(a) කැපබලය / පියවීම සම්බන්ධයෙන් ගිවිසුම

බැංකුව සන්තකයට පත්වන හෝ පත්වනු ඇති යම් සුරක්ෂිතයක් සහ දේපළක් මත බැංකුවට කැපබලයක් සහ/හෝ සුරක්ෂිත අයිතියක් අවශ්‍ය වන බවට ගනුදෙනුකරු සහ බැංකුව එකඟ වෙයි. ඉහත කී කරුණ බැංකුවට හිමිකම පවතින සියයිම පොදු හෝ බැංකුකරුගේ කැපබලයක් හෝ පියවීමේ අයිතියකට හෝ වෙනත් අයිතියකට අදාලි විරහිතව වේ. එම අරමුණ සඳහා බැංකුව විසින් නියම කරනු ලබන යම් ක්‍රියාවක් සිදුකිරීමට හෝ යම් දේවනයක් අත්සන් කිරීමට ගනුදෙනුකරු භාරගනියි.

(b) සුරක්ෂිත කළ අයැදීම

බැංකු සම්බන්ධයට මගින් පැන නගින (මෙම නිතිරීති හා කොන්දේසි යටතේ, යම් විශේෂ කොන්දේසි යටතේ හෝ යම් ගිවිසුමේ හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන් පැන නගින සහය, අනාගත හෝ අනාවූ ආකාරයේ, මුදලින්, ඇස හෝ වෙනත් ආකාරයක සහ මිනුම මුදල් වර්ගයකින්), ගනුදෙනුකරුට එරෙහිව බැංකුවට හිමිකම ඇති, දැනට පවතින, අනාගත හෝ අනාවූ ආකාරයේ සියලු අයැදීම් ආවරණය කර ගැනීමට කැපබලය හා සුරක්ෂිත අයිතිය මගින් බලාපොරොත්තු වේ.

(c) ලාභාංශ කුපන්පත් මත පොලිය

සුරක්ෂිතයන් බැංකුවේ කැපබලය/අයිතියට යටත් වන විට, එම සුරක්ෂිත වලට අදාළව පොලී සහ ලාභාංශ කුපන්පත් ලබා දෙන ලෙස ඉල්ලා සිටීමේ ගනුදෙනුකරුට හිමිකමක් නොපවතී.

17. බැංකුකරණ රහසාභාවය

ගනුදෙනුකරුට අදාළ කරුණු සම්බන්ධයෙන් පොදු නීතිය යටතේ රහසාභාවය පවත්වාගෙන යාමට බැංකුවට යුතුකමක් පවතින අතර, 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වගන්තිය ප්‍රකාරව බැංකුවේ නිලධාරීන් මත ද ඊට සමාන බැඳීමක් පනවා තිබේ. කෙසේ වුවද, අධිකරණයක් විසින් නියම කළහොත් හෝ ගනුදෙනුකරු විසින් අවසර දී ඇති විට හෝ ස්වකීය රාජකාරී ඉටුකිරීමේ හෝ දේශීය හෝ ජාතාන්තර වශයෙන් නීතියෙහි යම් ප්‍රතිපාදනයකට අනුකූලව ක්‍රියා කිරීම සඳහා හෝ බැංකුව විසින් ගනුදෙනුකරු පිළිබඳ හෝ ඔහුගේ ගනුදෙනු හෝ ගිණුම් සම්බන්ධයෙන් තොරතුරු හෙළිදරව් කරනු ඇත.

18. හෙළිදරව් කිරීම

පහත අයවලුන්ට තමා පිළිබඳ හෝ තම ගනුදෙනු හෝ ගිණුම් සම්බන්ධයෙන් තොරතුරු හෙළිදරව් කිරීමට ගනුදෙනුකරු මෙමගින් බැංකුවට අවසර දී සිටියි.

(a) ගනුදෙනුකරුගේ හෝ බැංකුවේ පවතින ඔහුගේ ගිණුම්වල කිසියම් ඇපකරුවෙකුට, තෙවන පාර්ශවයක සුරක්ෂිත සපයන්නෙකුට බැංකුව විසින් ගනුදෙනුකරුට සපයනු ලබන බැංකු පහසුකමක් හෝ සේවාවක් සම්බන්ධයෙන් හෝ;

(b) සෘජු හෝ වි්‍යවර්ජිතයෙකුට, සහභාගීවන්නෙකුට හෝ ගිවිසුම්කර පාර්ශවකරුවෙකුට ගනුදෙනුකරු සම්බන්ධයෙන් බැංකුවට ඇති අයිතිවාසිකම් හෝ බැඳීම් සම්බන්ධයෙන්,

(c) දේශීය සහ විදේශීය නියාමන ආයතන වලට, ණය තොරතුරු කාර්යාංශ වලට හා බැංකුව වෙත සපයන්නන්හට.

19. වගකීම පිළිබඳ මූලධර්ම

ස්වකීය වගකීම ඉටු කිරීමේදී බැංකුව එහි කාර්යමණ්ඩලයේ වෙකනාන්වීත පැහැර හැරීම් හෝ බරපතල නොසැලකිලිමත් භාවය සම්බන්ධයෙන් පමණක් වගකිව යුතු වේ. ගනුදෙනුකරුගේ ම වරදකින් ගනුදෙනුකරු හානියක් සිදුවීමකට දායක වී ඇති විට (උදා- මෙම කොන්දේසිවල සඳහන් රාජකාරී පැහැර හැරීම) බැංකුව හා ගනුදෙනුකරු විසින් දැරිය යුතු පාඩුවෙහි ප්‍රමාණය සාදාරයක නොසැලැකිලිව පිළිබඳ මූලධර්ම මගින් තීරණය වනු ඇත.

20. හානිපූරණය

ගනුදෙනුකරුට ණයවර හෝ වෙනත් බැංකු පහසුකම් ලබාදීම මගින් හෝ ගනුදෙනුකරු වෙනුවෙන් යම් බැංකු සේවාවක් ඉටුකිරීම මගින් හෝ උද්ගත වන කිසියම් හෝ සියලු අයැදීම්, ඉල්ලීම්, හඬුසර, හානි, වගකීම්, පිරිවැය, පාඩු, වියදම් සහ බැංකුවට විඳින්නට හෝ දරන්නට සිදුවන වෙනත් මුදල් ප්‍රමාණ ගනුදෙනුකරු විසින් බැංකුව වෙත හානිපූරණය කළ යුතු වන අතර, එම හේතු මත බැංකුව විසින් සිදුකළ හෝ දරා ඇති එවැනි යම් වෙනම් ඉල්ලා සිටීම මත හානිපූරණය කළ යුතු වේ. බැංකුවේ පාරිභෝගයන් කිසිදු චේතනාත්මක පැහැර හැරීමක් නොමැතිව ගනුදෙනුකරුගේ හෝ ඔහුගේ නියෝජිතයාගේ මෙනෙහි ශක්තුනාව හෝ ඊට ඇති සීමාවන් පිළිබඳ බැංකුවට දැනුම්දී නොමැතිව්මෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවට දරන්නට සිදුවන පාඩු සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කළ යුතුය.

21. කාලාවරෝධය

ණය මුදලක් සහ ඒ මත පොලිය සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතුව ඇති සියලු මුදල් කාලාවරෝධී ආඥාපනත (68 පරිච්ඡේදය) නොහකා අයකරගත හැකි වනු ඇති අතර, එසේ මුදල් අයකර ගැනීමේදී ගනුදෙනුකරුට එරෙහිව නඩු පැවරීමට බැංකුවට පවතින බාධාවක් ලෙස කාලාවරෝධී ආඥාපනත (68 පරිච්ඡේදය) ඉදිරිපත් නොකිරීමට ගනුදෙනුකරු එකඟ වේ.

22. පාලනයෙන් බැහැර සිදුවීම

කැරලි, යුද්ධ, ස්වභාවික විපත්, බැංකුවේ පාලනයෙන් පරිබාහිර තත්ත්වයක් හෝ බැංකුව විසින් වගකිව යුතු නොවන වෙනත් සිදුවීම් (උදා- ව්‍යවර්ජන, වාහන අවහිරතා, සිවිල් ගැටුම්, දේශීය හෝ විදේශීය රජයන්ගේ හෝ වෙනත් අධිකාරීන්ගේ ක්‍රියා (නොනිතිය හෝ තත්ත්වාසාරය), යම් නීතියක හෝ රෙගුලාසියක නියමයන්, වෙළඳපොල බාධාවීම් හෝ සමාව කිරීමේ නියෝජිත ආයතන හෝ මධ්‍යම කැන්සල ආයතන වල යම් ක්‍රියාවන්) ද ඇතුළත් නමුත් ඊට සීමා නොවී, පාලනයෙන් බැහැර සිදුවීමක් හේතුවෙන් හෝ එමගින් සිදුවන කිසියම් පාඩුවක් හෝ ක්‍රියා කිරීමට නොහැකි වීමක් සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවේ.

23. තොරතුරු සහ දැනුම්දීම

(a) ගනුදෙනුකරුගේ නම, ලිපිනය සහ වෙනත් තොරතුරු මෙන්ම යම් කැනැත්තෙකු වෙත පවරා ඇති නිශ්චිත කාර්යභාර බලයෙහි (විශේෂයෙන්ම ඇටෝර්නි බලය) අවසන් වීමක් හෝ සංශෝධනයක් හෝ යම් කැනැත්තෙකුගේ බලධාරීයෙහි සිදුවන යම් වෙනස්වීමක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් ප්‍රමාදයකින් තොරව ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතු අතර, යම් රජයේ රෙජිස්ට්‍රාරයක ගනුදෙනුකරුගේ තොරතුරු වල සිදුවන යම් වෙනස්වීමකට ද අදාළ වනු ඇති අතර, නියෝජිත බලය එවැනි යම් රජයේ රෙජිස්ට්‍රරයක වාර්තාගත කර ඇති විට සහ එහි අවසන්වීමක් හෝ ඊට යම් සංශෝධනයක් එසේ රෙජිස්ට්‍රරයේ ඇතුළත් කළ විට ද මෙම දැනුම්දීමේ යුතුකම පවතිනු ඇත.

(b) ගනුදෙනුකරුගේ වෙළඳාමේ, ව්‍යාපාර හෝ වත්තිකය සහ මූල්‍ය තත්ත්වය සම්බන්ධ සියලු තොරතුරු හෝ ඒ හා සම්බන්ධ වෙනස්වීම් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත සැපයිය යුතු වේ.

(c) ගනුදෙනුකරුගේ මූල්‍ය ශක්තුනාවය මිදුවීමට ඉඩ ඇති යම් නවු පැවරීමක් හෝ නවුපැවරීමේ හැකියාවක් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත හෙළිදරව් කළ යුතු වේ.

(d) බැංකුවට ස්වකීය අභිමතය පරිදි සහ වගකීමක් රහිතව ගනුදෙනුකරු වෙත සාමාන්‍ය තැපෑලෙන්, අතින්, ටෙලෙක්ස් හෝ ෆැක්ස් මගින් හෝ රීමේදී මගින් (බැංකුව විසින් දැන සිටින අවසානයට දන්නා ලිපිනයට, ටෙලෙක්ස් අංකයට හෝ ෆැක්ස් අංකයට හෝ රීමේදී ලිපිනයට) දැන්වීමක්, පණිවුඩයක්, සාධන පත්‍රයක් හෝ ලේඛනයක් යැවීමේ හිමිකම පවතින අතර, එවැනි සන්නිවේදනයක් (දේශීය නම්) තැපෑල් කර දින දෙකකට පසුව, (විදේශීය නම්) තැපෑල් කර දින පහකට පසුව, (ටෙලෙක්ස් හෝ ෆැක්ස් හෝ රීමේදී නම්) සම්පේෂණය කරන වේලාවේදී හෝ (අතින් හාරවීමේදී) හාරවීමේන් පසුව ගනුදෙනුකරු වෙත ලැබී ඇතැයි සැලකෙනු ඇත.

24. අවසන් කිරීම

I.ගනුදෙනුකරු සතු අවසන් කිරීමේ අයිතිය

අවසන් කිරීමේ ප්‍රතිපාදනයකට බැංකුව සහ ගනුදෙනුකරු වෙනත් ආකාරයකට ලිඛිතව එකඟ වී නොමැති නම්, ගනුදෙනුකරුට ඕනෑම අවස්ථාවකදී සාධාරණ පූර්ව දැනුම්දීමක් සිදුකර ගිවිසුම සම්පූර්ණයෙන් හෝ නිසිලෙස අත්සන් කළ සහ පිළිගත් මැන්ඩේට පත්‍රයෙන් පැන නගින විශේෂිත ගිවිසුමක් අවසන් කළ හැකිය. මෙසේ වුවද, එවැනි අවසන් කිරීමක් මගින් එම අවසන් කිරීමට පෙර බැංකුවට ලැබී ඇති අයිතීන් වලට බලපෑමක් සිදු නොවනු ඇත.

II. බැංකුව සතු අවසන් කිරීමේ අයිතිය

(a) දැනුම්දීමකින් පසු අවසන් කිරීම

බැංකුවේ මතයට අනුව සාධාරණ දැනුම්දීමක් සිදුකිරීමෙන් පසුව, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක ගිවිසුම සම්පූර්ණයෙන් හෝ නිසිලෙස අත්සන් කළ සහ පිළිගත් මැන්ඩේට පත්‍රයෙන් පැන නගින විශේෂිත ගිවිසුමක් අවසන් කළ හැකිය. දැනුම්දීමේ කාලසීමාව සීරුවෙන් තීරණය කිරීමේදී ප්‍රායෝගිකව හැකි සෑම විටකම බැංකුව විසින් දැනුවත්ව සිටින ගනුදෙනුකරුගේ සාධාරණ ගැටලු සම්බන්ධයෙන් සැලකා බලනු ඇත.

(b) ස්ථිර කාලසීමාවක් නොමැතිව ණය සහ පහසුකම් අවසන් කිරීම

ස්ථිර කාලසීමාවක් හෝ අවසන් කිරීමේ ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් ලිඛිතව එකඟ වී නොමැති ණයඉල්ලුම් හෝ ණයවර හෝ බැංකු පහසුකම්/ඇපවීම් බැංකුව විසින් සිය අභිමතය පරිදි පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැකිය.

(c) දැනුම්දීමකින් තොරව, සාධාරණ හේතුවක් මත අවසන් කිරීම

ගනුදෙනුකරුගේ දන්නා සාධාරණ ගැටලු පිළිබඳ නිසි ලෙස සලකා බැලීමෙන් පසුව, ව්‍යාපාරික සම්බන්ධතාව පවත්වාගෙන යාමට බැංකුවට පිළිගත නොහැකි වන ආකාරයේ සාධාරණ හේතුවක් පවතින්නේ නම්, ව්‍යාපාරික සම්බන්ධතාව සම්පූර්ණයෙන් හෝ නිසිලෙස අත්සන් කළ සහ පිළිගත් මැන්ඩේට පත්‍රයෙන් පැන නගින විශේෂිත සම්බන්ධතාවක් දැනුම්දීමක් නොමැතිව අවසන් කිරීමට අවසර ඇත.

(d) අවසන් කිරීමට පසුව පියවීම

සම්බන්ධතාව හෝ පහසුකම් හෝ අවසන් කිරීමෙන් පසු, ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ගෙවිය යුතුව ඇති සියලු මුදල් සහ වගකීම් හිඟව සහ ඉල්ලූ විට වහාම ගෙවිය යුතුව පවතිනු ඇති අතර, බැංකුව සහ ගනුදෙනුකරු අතර සියලු විදේශීය සහ වෙනත් ව්‍යුත්පන්න ගනුදෙනු බැංකුවේ අභිමතය පරිදි කල්බඳා අවසන් කෙරෙනු ඇති අතර, බැංකුව විසින් තීරණය කරනු ලබන එවකට පවතින වෙළඳපොල වටිනාකමට අනුව හිඟව ගෙවිය යුතු වනු ඇත. ගනුදෙනුකරු වෙතින් බැංකුවට ලැබිය යුතු යම් හිඟ මුදලක් හෝ අනාගත වගකීමක් හෝ සම්බන්ධයෙන් බැංකුව ඉල්ලා සිටින ආකාරයේ නීතිරීති මත ඒ සඳහා ගනුදෙනුකරු විසින් වහාම ප්‍රමාණවත් මුදල් ආවරණයක් සැපයිය යුතු වේ.

(e) අයිතීන් සුරැකීම

යම් ගිවිසුමක් සම්පූර්ණයෙන් හෝ ඉහත දක්වා ඇති යම් ප්‍රතිපාදනයක් යටතේ පවතින යම් විශේෂිත සම්බන්ධතාවක් අවසන් කිරීම හෝ මගින් එම අවසන් කිරීමට පෙර බැංකුවට හිමි ඇති අයිතීන් බලපෑමක් සිදු නොවනු ඇත.

25. පැවරීම

බැංකුව යටතේ පවතින ස්වකීය අයිතීන් සියල්ල හෝ කිසිවක්, ගනුදෙනුකරු වෙතින් පූර්ව අනුමැතිය ලැබීමකින් තොරව, වෙනත් පාර්ශවයකට පැවරීමට බැංකුවට අයිතිය පවතිනු ඇත.

26. ප්‍රතිපාදන වල අවලංගු භාවය

යම් අවස්ථාවක මෙහි ඇති කිසියම් ප්‍රතිපාදනයක් යම් ආකාරයකින් නීතිවිරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වන්නේ නම්, එම කිසිවිරෝධී භාවය, අවලංගු භාවය හෝ බලාත්මක කළ නොහැකි බව මගින් මෙහි ඉතිරි ප්‍රතිපාදන වලට හානියක් හෝ බලපෑමක් සිදු නොවනු ඇත.

27. අයිතීන් අතහැරීම

යම් විශේෂ අවස්ථාවක් හෝ සිදුවීමක් සම්බන්ධයෙන් මෙම නිතිරීති හා කොන්දේසි වලින් කිසිවක් බැංකුව විසින් දරාගැනීමක්, නොසලසා හැරීමක් හෝ අතහැරීමක් මගින් ඉන් පසුව එය සම්පූර්ණයෙන් බලාත්මක කිරීමට බැංකුවට අයිතීන් වලට අගතියක් සිදු නොවනු ඇත. බැංකුව විසින් සිදුකරන කිසිදු අයිතීන් අතහැරීමක් ලිඛිතව සිදුකළහොත් හැර බලාත්මක නොවනු ඇත.

28. අධිකරණ බලය සහ පාලනය වන නීතිය

(a) අධිකරණ බල ප්‍රදේශය

වෙනත් යම් රටක හෝ වෙනත් යම් අධිකරණයක ගනුදෙනුකරුට විරුද්ධව ක්‍රියා කිරීමට බැංකුවට ඇති අයිතියට අගති විරහිතව, ගනුදෙනුකරු අවලංගු කළ නොහැකි ලෙස ශ්‍රී ලංකාවේ අධිකරණයේ අනන්‍ය නෙවන අධිකරණ බලයට ධනාත්මක වශයට යටත් වේ (බැංකුවට එරෙහිව උ නඩු පැවරිය හැක්කේ ශ්‍රී ලංකාවේ අධිකරණ වල පමණි).

(b) හරයාත්මක නීතිය

මෙහි දක්වා ඇති ව්‍යාපාරික සම්බන්ධතාව, ගනුදෙනුකාර ගිණුම්, ගනුදෙනු සහ මැන්ඩේට පත්‍රය ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය වනු ඇත.

29. අගය එකතු කළ සේවාවන්

බැංකුව විසින් පිරිනමනු ලබන අගය එකතු කළ සේවාවන් සම්බන්ධයෙන් අදාළ ගාස්තු සහ උපායය සමඟ සියලු නීතිරීති සහ කොන්දේසි පරීක්ෂා කරගැලීම පිණිස බැංකුවේ වෙබ්අඩවියෙන් ලබාගත හැකි අතර, නිසියාකාර ලෙස වෙබ්අඩවිය යාවත්කාලීන කිරීම මගින් බැංකුවේ අභිමතය පරිදි ඒවා කලින් කලට වෙනස්විය හැකි වේ. එසේම, බැංකුව විසින් අනාගතයේදී හඳුන්වා දෙනු ඇති නව සේවාවන් කිසිවක් වෙනෙත්, ඒවා සම්බන්ධයෙන් වන නීතිරීති සහ කොන්දේසි ද වෙබ්අඩවියෙන් ලබාගත හැකි වනු ඇත.

SRP GRAPHIC (PVT) LTD. 01020150-V1.1